# කලාවට සම්බන්ධ ඉහළ තනතුරු දරන සමහරු අපේ නම වත් දන්නෙ නැහැ

## නාරද දිසාසේකර

අනුර හොරේෂස්



**ප්‍රවීණ** ගායන ශිල්පීන් ත්‍රිත්වයත් වන නාරද දිසාසේකර, දයාරත්න සහ අමරා රණතුංග ලබන ජූලි මාසයේ දී ඔස්ට්‍රේලියාවේ සංචාරයක යෙදීමට නියමිත ය. ඒ ඔස්ට්‍රේලියාව පුරා පවත්වන සංගීත ප්‍රසංග කීපයකට සහභාගි වීම සඳහා ය. එබැවින් මෙම ශිල්පීන් සමග සාකච්ඡාවක යෙදීම මැනැවැයි මට හැඟී ගියේ එම අත්දැකීම් ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික රසවතුන්ට අගනා අත්දැකීමක් වන බැවින් ය. විශේෂයෙන් ප්‍රසිද්ධිය සහ මාධ්‍ය පසුපස දිව නොයන මෙම ගායන ශිල්පි ත්‍රිත්වයෙන් නාරද දිසාසේකර ගායකයාණෝ සුප්‍රසිද්ධ එහෙත් සැඟවුණ චරිතයකි. ඒ සැඟවුණ චරිතය සමග දුරකථනය ඔස්සේ කළ කතා බහක් මෙසේ සටහන් තබමි.

***ඔබ චිත්‍රපට පසුබිම් ගායකයෙක්. ඒ අතීතය මතක් කලොත්?***

ශ්‍රී ලංකාවේ පළමුවැනි වෛවර්ණ සිංහල චිත්‍රපටය වන රන්මුතුදූව චිත්‍රපටය හරහා තමයි මම චිත්‍රපට පසුබිම් ගායකයෙක් වුණේ. ඒ චිත්‍රපටයේ ප්‍රධාන චරිතය රඟපෑවේ ගාමිණී ෆොන්සේකා., ජීවරාණී කුරුකුලසූරිය, ජේන් ගුණරත්නසහ තවත් ජනප්‍රිය සිනමා ශිල්පීන්. ඒ චිත්‍රපටයට පසුබිම් ගීත තුනයි තිබුණේ. ඩබ්ලිව් ඩී අමරදේව මහතා සංගීතය අධ්‍යක්ෂණය කළ එහි ගීත පද මාලා ලියුවේ අභාවප්‍රාප්ත චන්ද්‍රරත්න මානවසිංහ මහතා. ඒ චිත්‍රපටයේ මා ගැයූ පිපී පිපී රේණු නටන ගීතයත් නන්දා මාලිනී ගැයූ ගලන ගඟකි ජීවිතේ යන ගීයත් ප්‍රථම සරසවි සම්මානයෙන් පිදුම් ලැබුවා. මේ ගීත අදත් අසන්නන් ඉතා හොඳින් රස විඳීම අපගේත් සිංහල සංගීත සාහිත්‍යයේත් වාසනාවක්. එතැන් පටන් චිත්‍රපට පසුබිම් ගායකයෙක් විදිහට ස්ථාවරව ගොඩ නගා නැගෙන්න මට පුලුවන් වුණා. ඉන් අනතුරුව සිකුරු තරුව, මනමාලයෝ , ගැටවරයෝ, සංගීතය අධ්‍යක්ෂණය කරමින් හතරමහ නිධානය ඇතුලු චිත්‍රපට රැසක මම ගීත ගායනා කළා.

***නාරද දිසාසේකර යන නාමය සංගීත ක්ෂෙත්‍රයේ සුවිශාල කීර්තියක් දිනාගත් නමක්. කොහොමද ඔබ ඒ කීර්තිමත් නාමය දිනාගන්න ක්‍රියා කළේ?***

සංගීත ක්ෂෙත්‍රයට පිවිසෙන මොහොත වනවිට මම කිසියම් තීරණයකට එළඹ සිටියා. ඒ අනුකරණ ගීත ගායනා නොකිරීමත් කිසිම ගායකයකු අනුකරණය නොකිරීමත් යන තීරණයයි. කිසිම දවසක මම හින්දි තනු වලට ගීත ගායනා කළේ නැහැ. සංගීතයේ පෝෂණය උදෙසා මගෙන් ඉටුවිය යුතු මෙහෙයක් තිබුණා නම් ඒ අරමුණ මුල් කරගෙන හරවත් නැවුම් පදමාලා වෙන් සහ වාi චෘන්දයෙන් පෝෂණය වූ ගීත පමණක් මම ගායනා කළා. කුලරත්න තෙන්නකෝන් නමැති සංගීත අධ්‍යක්ෂවරයා ජනප්‍රිය වූ මගේ ගීත බොහෝමයක තනු නිර්මාණය කළා. චන්දන ඇඟ ගාලා, මුලු හදින් මම ඇයට පෙම් කොට, එවැනි ගීත කීපයක්. මුල් යුගයේ කරුණාරත්න අබේසේකර, එඩ්මන්ඩ් ජයසූරිය වැනි අය මගේ ජනප්‍රිය ගීත රචනා කළා. චිත්‍රපට වලදී මහගම සේකර, මඩවල එස් රත්නායක, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහවැනි ශ්‍රේෂ්ඨ කලාකරුවන් මට උදව් කළා.



***ඒත් දක්ෂ ශල්පියෙක් වශයෙන් චරිතයක් වශයෙනුත් ඔබ ඉතාමත්ම නිහඬයි. ඒ නිහඬ බවට හේතුව කුමක් ද?***

මම හිතන්නේ කලාකරුවෙක් බොහෝම නිහතමානී වෙන්න ඕනෑ. ප්‍රසිද්ධිය සඳහා මම කා පසුපසවත් යන්නේ නැහැ. ප්‍රසිද්ධිය දෙන්න ඕනෑ නම් මට ඒක ලබාදේවි. එවැනි නිගමනයකයි මම ඉන්නෙ. මම අනුතමනය කළේ ආනන්ද සමරකෝන් සහ සුනිල් සාන්තයන් ව.. ඔවුන් දොපොලගේ ජීවන රටාව මගේ ජීවිතය සමග ඉතා තදින් බැඳුණා. ඔවුන් බොහොම නිහඬවාම් චරිත. ජීවිතය දිහා ඉතා උපේක්ෂාවෙන් බැලූ මෙම ශ්‍රේෂ්ඨ කලාකරුවන් දොපොල ලාබ ප්‍රයෝජන සඳහා කිසි විටෙක සංගීත කලාව යොදා ගත්තෙ නැහැ. ප්‍රසිද්ධිය පසුපස දිවගියේ නැහැ. සංගීත සාහිතක්‍යයේ පෝෂණය සඳහා ඉතා නිහඬ සේවාවක් ඔවුන් අතින් සිදුවුණා. ඉතින් ඒ නිහඬ බව තමයි මගේ සිරුරටත් කා වැදී තිබෙන්නේ.

***ලංකාවේ ප්‍රසිද්ධ වේදිකාවේ ගී නොගයන ඔබ විදෙස් රටවල ප්‍රසංග වලට යනවා. ඒ වෙනසට හේතුව මොකක් ද?***

කලාතුරකින් තමයි ලංකාවේ ප්‍රසංගයකට සහභාගි වෙන්නෙ. නමුත් පිටරය වල ජීවත් වෙනවා අපේ යුගයේ රසවතුන්. ඔවුන් තාමත් ආසයි අපේ ගීත රසවිඳින්න. ප්‍රචලිත ගීත වගේම මගේ අප්‍රකට ගීත රාශියක් තියෙනවා. පිටරටවල බවත්වන ප්‍රසංග වලදී ඒ දෙවර්ගයම මම ගයනවා. පිපී පිපී, ආරිච්චි බොරිච්චි වගේ වේග රිද්ම ගීත. වේග රිද්ම යනුවෙන් මම අදහස් කරන්නේ දේශීය සංගීතය මුසු වමු ගීතයි. ඒ වගේම විරහ ගී, පරිසරය ගැන ලියැවුණ ගී පවා මගේ ගී කාලසටහනට ඇතුළත්. අද විදෙස්ගත වී සිටින රසවතුන්ට බොහෝ විට අසන්නට ලැබෙන්නේ සීඩී තැටි වලට ඇතුලත් ගීත. ඒ සීඩී තැටි වල අපේ ගීත නැහැ. අපේ වගේම තවත් ජනප්‍රිය ශිල්පීන් රාශියකගේ ගීත ඒවායේ නැහැ. ඉතින් එවැනි ලස්සන ගීත සමූහයක් පිට රටවල වෙසෙන සංගීත ලෝලීන්ට සජීවීව අසන්නට නරඹන්නට සැළැස්වීම ඉතා හොඳ කටයුත්තක්. ඒ වගේම තවත් වැදගත් කාරණාවක් තිබෙනවා. මෙවැනි ප්‍රසංග වලට සහභාගි වීමෙන් සංගීත රසකාමීන් වගේම මාත් ගීත ගයමින් වින්දනයක් ලබනවා. ඒ වින්දනය මගේ මුහුණින්, හඬින්, ගායන ශෛලියෙන් ප්‍රකාශ වන විට එය නරඹන ගීත රසකාමීන්නුත් හදවතින් ප්‍රසංග වේදිකාව සමග බැඳෙනවා. ඉතා උත්කෘෂ්ඨ අවස්තාවක් වගේම මනමෝහනීය අත්දැකිමක් වෙනවා.

***ඔබ වැනි වටිනා කලාකරුවන් අපේ රටේ වගකිවයුතු තවතුරු දරන පුද්ගලයන්ට අමතකව ගොස් තිබෙන බවයි මගේ අදහස. ඇත්තෙන්ම ඔබ කලකිරීමකින් නේද පසුවෙන්නෙ?***

ඔව්.. මම මේ කියන්නේ ජනප්‍රියකම ගැන නොවෙයි. අපි වැනි ශිල්පීන් සංගීතයට යමක් කළා ද? එයින් රටවැසියන්ට සහ ගීත 'සාහිත්‍යයට පෝෂණයක් ලැබුණා ද යන කාරණය සොයා බලන්න වගකිවයුත්තෙක් නැහැ. අඩුම තරමේ අද කලාවට සම්බන්ධ ඉහළ තනතුරු දරන සමහරු අපේ නමවත් දන්නේ නැහැ. ■

---



# මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

## අජිත් ද සිල්වා හමුවුණ මොහොතක

මෙල්බන් පුරවරයේ කැපී පෙනෙන ශ්‍රී ලාංකිකයන් සමඟ මුහුණට මුහුණ හමුවී කතා බහ කරන්නට අපි හිතුවා. ගමන ආරම්භ කරද්දිම අපට හමු වුණේ මෙහි ප්‍රකට කලාකරුවෙක්. ඔහු අජිත් ද සිල්වා.

**ශ්‍රීනාත්.**
මෙල්බන් පුර්වරයේ වෙසෙනෙ අපේ කලා කරුවන් අතරින් ඕනෑම කලා කටයුත්තක් කෙරෙන තැනකදී හමු වන විශේෂිත පුද්ගලයෙක් ලෙස අජිත් ද සිල්වා හැඳින්නුවට වරදක් නෑ කියලා මට හිතෙනවා. ... අජිත් ඒ කතාව හරි



නේද?

**අජිත්**
ඔව් ශ්‍රීනාත්.. මං හිතනවා හරි කියලා.. මොකද කලාව, සාහිත්‍යයට අදාල ඕනෑම කටයුත්තකදී එයට සහභාගිවීම හෝ එයට සම්බන්ධව කටයුතු කරන එක තමයි මගේ එකම විනෝදය.. ආශාව.. මම විතරක් නෙවෙයි මගේ බිරිඳ දරුවන් සියලු දෙනාම එහෙමයි... ඒකට එකම හේතුව තමයි ශ්‍රී ලංකාවේ වෙසෙන කාලයේදීත් මම කලාව සාහිත්‍යය වෙනුවෙන් සෑහෙන කැපවීමක් කළ එක.. ඒ කාලයේ මම සම්බන්ධවෙලා හිටපු වේදිකා නාට්‍ය වලට මගේ රැකියාවෙන් නිවාඩු ගන්න බැරි වුවත් රැකියාව පැත්තක තියලා මම ඒ නාට්‍ය වලට සහභාගිවෙලා තියෙනවා.. මා හිතන්නේ එහෙම වෙන්න හේතුව මේ සියළු දේවල් මගේ ඇඟට කාවැදිලා තියෙන නිසා කියලා... ඒ වගේම කව්රු හෝ මගෙන් කලා කටයුත්තකට උදව්වක් ඉල්ලුවොත් මම කිසිම පැකිලීමක් නැතිව එයට උදව් කරනවා.. ප්‍රවීණ ආධුනික කියලා මට වෙනසක් නැහැ.. මම හිතන්නෙ හැමෝම කලාකරුවන් කියලා..

**ශ්‍රීනාත්.**
ලංකාවේදි ගීත ගායනා කළේ නැහැ නේද..?

**අජිත්**
ඇයි නැත්තෙ.. අත්, මෝරා, අවමානව යන නාට්‍ය වල කෝරස් එකේ ප්‍රධාන භූමිකාවක් කළා මතක නැද්ද ..?

**ශ්‍රීනාත්.**
ඔව් මට මතකයි.. නමුත් ගීත පටිගත කළේ නැහැ නේද?

**අජිත්**
මම ගීත කීපයක් පටිගත කළා.. නමුත් එළියට දැම්මෙ නැහැ.. කේමදාස මාස්ටර් තමයි මගේ ගීත ගායනා කිරීමේ හැකියාව ඉදිරියට ගත්තෙ... මං මුලින් සඳහන් කළ නාට්‍ය සියල්ලෙම සංගීත කටයුතු කළේ කේමදාස මාස්ටරුත් ග්‍රැන්විල් රොඩ්‍රිගුත්.. මේ වෙලාවෙ මං ඔහුවත් ආදරයෙන් මතක් කරනවා..

**ශ්‍රීනාත්.**
කැළණි පාලමෙන් පස්සෙ මොකක්ද ඉස්සරහට කරන්න හිතන්නේ?

**අජිත්**
කැළණි පාලම නාට්‍යයේ මම රඟ පෑ චරිතයට හොඳ ප්‍රතිචාරයක් ලැබුණා.. ඒ ගැන මට හුඟක් සතුටුයි.. මං හිතනවා මංගෙ අතින් ඒ චරිතයට සාධාරණය ඉෂ්ඨ වුණා කියලා.. මේක ටිකක් සංකීර්ණ චරිතයක්.. එහිදී මට කැළණි පාලමේ රඟ පෑ ශ්‍රී ලංකාවේ ප්‍රවීණ නළු නිලියන්ගෙනුත් මෙහේ නලු නිලියන්ගෙනුත් උදව් උපකාර ලැබුණා..

**ශ්‍රීනාත්.**
රඟපෑම, ගීත ගායනා කිරීමට අමතරව ටෙලිනාට්‍ය නිෂ්පාදක වරයෙක් වෙලා නේද?

**අජිත්**
ඔව් ශ්‍රීනාත්.. මං හුඟක් කාලයක් ඉඳලා බලාපොරාත්තු වුණා හොඳ ටෙලි නාට්‍යයක රඟපාන්නත් හොඳ ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කරන්නත්.. ඔහොම ඉන්න අතරෙදි ආර් ආර් සමරකෝන් මහත්මයගෙ එක කුසේ උපන් එවුන් කියන නවකාතා පොතට අනුව තිර රචනය කළ පිටපතක් ලැබුණා.. මේ ටෙලි නාට්‍යය අධ්‍යක්ෂණය කළේ ප්‍රවීණ අධ්‍යක්ෂ වරයෙක් වන නිහාල් ප්‍රනාන්දු. මෙහි ප්‍රධාන භූමිකාවරඟපෑවා ශ්‍රී ලංකාවේ ජනප්‍රිය නලු නිලියන් වන ශ්‍රියන්ත මෙන්ඩිස්, කුසුම් රේණු, රම්‍යා වනිගසේකර, නලින් ප්‍රදීප් උඩුවෙල, ඉන්දිකා උපමාලි ඇතුළු නලු නිලියන් රැසක් මෙහි රඟපානවා. සංගීතය ආචාර්ය ප්‍රේමසිරි කේමදාස ශූරීන් විසින් සපයනු ලබනවා.

මේ ටෙලි නාට්‍යය ජාතික රූපවාහිණිය මගින් පිටපත අනුමත වෙලා නිෂ්පාදනය කල එකක්.

**ශ්‍රීනාත්.**
ඔබේ මේ නිර්මාණය මෙල්බන් රසිකයන් හමුවට ගෙන එන්නට සූදානම් බව දැනගන්න ලැබුණා..

**අජිත්**
ඔව්.. එක කුස උපන් එවුන් ජූලි 16 වන දින සවස 3.30 ට ඩීකින් සරසවියේ බර්වුඩ් මණ්ඩපයේ දේශණ ශාලා අංක 1 හි තිරගත වෙනවා.

ඉතින් මෙල්බන් පුරවරයේ කලා ක්ෂෙත්‍රයේ කැපී පෙනෙන සේවයක් කරන අජිත් සිල්වා ගේ එක කුස උපන් එවුන් නරඹන්න එක්වන්නැයි අපි ත් ඔබෙන් ඉල්ලා සිටිනවා. එය ඔහුට මහත් ධෛර්යක් වේවි. ■